නිහඬ වන අසම්මතය

අසම්මත ආදර කථාවක් අප එදිනෙදා ජීවත් වන සමාජය තුලින් අසන්නට ලැබුනොත් අපේ ප්‍රතිචාරය කුමක් දැයි සිරිමෙවන් කල්පනා කරන්නට වුනා. අසවල් මිනිසා තමන් ගේ බිරිඳට හොරා සම්බන්ධයක් පවත්වාගෙන යන බවත් එනිසා ඔහු වල් මිනිසකු බවත් පැතිර යන ඕපාදූපය ලැව් ගින්නකට වඩා රෞද්‍රරූ බව සැකයක් නොවේ. බටහිර සමාජයේ කෙසේ වෙතත්, ආසියාතික සංස්කෘතියන් තුල ගැහැණියක ගෙන් ඉහත කී ආකාරයේ වැරැද්දක් සිදුවුවහොත් ඇය විඳින විපාක සතා සිව් පාවකු වුවද දන්නා බව සිරිමෙවන්ට පැහැදිලිය. එවන් අසම්මත ක්‍රියාවක් සිදුවූ වහාම මිතුරන් නෑදෑයන් පමණක් නොව දන්නා හඳුනන ඕනෑම කෙනෙකු අදාල පුද්ගලයා විනිශ්චය කරනුයේ ඉතාම සරල අකාරයකටය. අදාල පුද්ගලයාට කොතරම් නිදහසට කරුණු තිබුනත් එවන් කරුණු දෙස සවන් යොමන්නකු සොයාගැනීම උගහටය.

එහෙත් රූපවාහිණය ඔස්සේ එලි දක්වන ටෙලි නාට්‍ය දෙස බැලුවිට එවායින් බොහොමයකට පාදක වී ඇත්තේ අසම්මත කථාවක්. එවන් නාට්‍ය කඳුලු පුරවාගෙන නරඹන රසික කැලෙන් එක් අයෙකුදු තමන් තිරයේ නරඹන චරිතයකට දක්වන අනුකම්පාවක් හෝ සවන් යොමු කිරීමක් තමන් දන්නා හඳුනන චරිතයකට නොදෙන්නේ ඇයිදැයි සිරිමෙවන්ට වැටහීමක් නැත. “Days of our lifes” සෝප් ඔපේරාව දිනපතා රූපවාහිණියේ නරඹන කී දෙනෙක් නම් සිරිමෙවන් දන්නේද. එහි නමින්ම දැක්වෙන පරිදි එය බටහිර සමාජයේ එදිනෙදා ජීවිතයේ කථාවයි. එහි එන චරිත හුදෙක් නරඹන්නන්ට සමීප චරිතයක් වී නම් ඔවුන්ගේ ප්‍රතික්‍රියාවන් කෙසේ වෙත්දැයි සිරිමෙවන් සිතන්නට වුනා. සෝප් ඔපෙරාව යන්නෙන්ම පැහැදිලි වන ආකාරයට ඇමෙරිකානු, බැවහර නුවණ හැරුනු කොට සංකල්පන ශක්තියෙන් තොර ඇමෙරිකානු ගෘහණියන් උදෙසා ලියවුනු සබන් විකිණීම මුලික අරමුණ කරගත් මෙම ප්‍රචාරශ්‍රීලී ටෙලි නාට්‍යවල පමණක් නොව, ශ්‍රී ලාංකික පහත් රුචිකත්වයෙන් අනුන සංකල්පන හැකියාවන් ගෙන් හීන පරපුරක් උදෙසා නිශ්පාදණය වන දහසකුත් එකක් ටෙලි නාට්‍යවලද අනුභූතිය බොහෝවිට අසම්මත කථාවකි. සංස්කෘතිය විසින් හීලෑ කරන ලද මිනිසා තුල නිරන්තරයෙන් පහල වී ක්‍ෂණිකව යටපත් කරගන්නා හැඟීම් චක්‍රාකාරයෙන් තෘප්තිමත් කරන ක්‍රමවේදයක් මෙම නාට්‍යවල ගැබ්ව ඇද්දැයි කෙනෙකුට අනුමාන කල හැකි නොවිදැයි සිරිමෙවන්ට හැඟුනි.

ලෝක පුජිත කලාකරුවන්ගේ නිර්මාණ බොහොමයක් විමර්ශණය කල හොත් ඉන් බොහොමයකට අනුභූතිය වී ඇත්තේ අසම්මත ආදර කථාවක්. ලෝක පුජිතවූ පෝල් ගොගෙන් චිත්‍ර ශිල්පියාගේ ජීවිත කථාව ලෙස හැඳින්වෙන ස්ට්‍රික්ලන්ඩ් නැමති චරිතයකට පණ පෙවූ “Moon & Six Pence” නවකථාවේ ද ප්‍රධාණ චරිතය අපේ සංස්කෘතික සීමාතුල නරුම වූ චරිතයක් නොවේදැයි සිරිමාන්න කල්පනා කරන්නට විය. එහෙත් එවන් චරිතයක් අප දන්නා හඳුනන්නේ නම් අනිවාර්යයෙන්ම අප සමාජය ඔහු පිලිකුල් කරන්නට පෙලඹෙන බව සිරිමාන්නට සැකයක් නැත. බටහිර ලේඛකයන් තම චරිතාපදාණයන් තුල තම අති පෞද්ගලික තොරතුරු බිඳකුදු නොසඟවා හෙලි කරන විට එවා උසස් කෘති වන්නත් එවැනිම කථාවක් දන්නා හඳුනන්නෙකු ගේ නම් අසංවර වල් චරිතයක් ලෙස හංවඩු ගසන්නේත් ඇයි දැයි සිරිමෙවන් කල්පනා කරන්නට විය. ඇරිස්ටෝටල් පඬිවරයාගෙන් පසු ලොව පහල වූ ශ්‍රේෂ්ඨ තම පඬිවරයකු ලෙස සැලකෙන බර්ට්රන්ඩ් රසල් තම චරිතාපදානයේ සිරිමෙවන් වැනි හුදී ජනයා රහසිගතව තබාගන්නා අති පෞද්ගලිකවූ ජීවන තොරතුරු නොපැකිල හෙලි කරන අතර එම තොරතුරු අතර ඔහුගේ අසම්මත ප්‍රේම සම්බන්ධයන් ගේ තොරතුරු ද වේ. එයින් ඔහු ගේ ප්‍රතිරූපයට කිසිදු කැලලක් වී නොමැත. මහාචාර්ය එදිරවීර සරච්චන්ද්‍ර තම “පිං ඇති සරසවි වරමක් දෙන්නේ..” යන කෘතියේ මේ පිලිබඳ කරන විග්‍රහය සිරිමාන්න ගේ සිතට අලුත් යමක් එක් කරන්නට උනා. එදිරිවිර සරච්චන්ද්‍ර මහතාට අනුව පෙරදිග සංස්කෘතීන් පිලිගන්නා උදවියට මෙවැනි අසම්මත කථා විඳ දරා ගැනීමට නොහැක. උදාහරණ වශයෙන් මහාචාර්තුමා මලයාලම් ජාතික කමලා දාස් කිව්දිය තම “මගේ කථාව” නම් කෘතියෙන් ඇයට තම සවාමියා කෙරෙහි තිබූ දෙබඩි සිත සහ වෙනත් පිරිමින් සමග තිබූ සබඳ කම් හෙලිකිරීමෙන් පසුව විඳින්නට වූ ගැහැට පෙන්වා දෙයි. තව දුරටත් කරුණු දක්වන එතුමා මාටින් වික්‍රමසිංහ ශූරීන් තම “උපන් දා සිට” කෘතියෙන් පෞද්ගලික කරුණු අනාවරණය කිරීමෙන් වැලකී ඇති අයුරු පෙන්වා දෙයි. ඉන් ඔබ්බට කරුණු දක්වන එතුමා ජී.බී. සේනානායක ශූරීන් තම “විනි විඳිමි අඳුර” ග්‍රන්ථයේ අති පෞද්ගලික කරුණු හෙලි කිරීම තම සතුරන්ට දෙන අත්වැලක් බව ඉඟි කරන බව පවසයි. මහාචාර්ය එදිරවීර සරච්චන්ද්‍ර තම “පිං ඇති සරසවි වරමක් දෙන්නේ” කෘතීය තම ජිවිත කථාව නොවන බව පැහැදිලිව පවසන අතර එම කෘතීයෙන් තම අති පෞද්ගලික තොරතුරු හෙලිකිරීමෙන් වැලකෙන්නේ තම ප්‍රතිරූපයට වඩා තම දූ දරුවන් ගේ යහපත උදෙසා යයි සිරිමෙවන්ට සිතේ. එහෙත් අති පෞද්ගලික කරුණු හෙලි කරන චරිතාපදාන වලින් ඇති කෙරෙන යහපත එතුමා එම කෘතීයෙන් ඉඟිකරන බව දකින සිරිමෙවන්ට ඇති වෙනුයේ වේදනාවකි. එවන් කරුණු හෙලිනොකලද මහාචාර්ය තුමා ඇතුලු ශ්‍රේෂ්ඨ කලාකරුවන් ගැන ලාංකික අප අතර පැතිරෙන



ඕපාදූප දන්නා සිරිමෙවන්, අප ආදරය කරන කලාකරුවකු තමා තමාවම විග්‍රහ කරගන්නා අයුරු දැන ගැනීමට කොතරම් කැමැත්තක් ඇද්දැයි දනී. තරුණ වියේදී නොපැකිල තමා සිතන පතන අයුරු ලියූ සමහර ලේඛකයන් දැන් සාධුවරයන් මෙන් පෙනී සිටීම ආත්ම වංචාවකැයි සිරිමාන්නට සිතේ. වාසනාවකට දෝ මහාචාර්ය එදිරවීර සරච්චන්ද්‍ර එම ගනයට නොවැටෙන අතර අවම වශයෙන් නොපැකිල පෞද්ගලික තොරතුරු හෙලිකිරීමකට ඇති බියට හේතු සැපයීම අගය කලයුතුය.

සිරිමෙවන් මුලදී සිතූ අකාරයට “Days of our lifes” හී චරිත ආදරයෙන් වැලඳ ගන්නා පෙරදිග අපගේ මිනිසුන්ම ඈත සිට අභිවාදනය කරන සමීපව දැන හැඳිනගැනීමට නොහැකි වන කීර්තිමත් අය අප වැනිම පෘතග්ජනයන් තුල තිබෙන දූර්වලකම් වලින් හෙබි අය බව පිලිනොගෙන, අප අතර සිටින මිනිසුන් පමණක් සුදූ කළු චරිත ලෙස විග්‍රහ කරන්නට තැත් කරන්නේ ඇයි දැයි සිරිමෙවන්ට නොවැටහේ.

සිංහළ අප වංශ කථාවල එන දස්කොන් හා රජ බිසව අතර ඇතිවන අනියම් ප්‍රේම සම්බන්ධය අපි පිලිකුල් කරන්නේද ! එසේ නම් “දස්කොන් මගෙ නමට ජීවිතෙ දෙනවාද !” යනුවෙන් ගැයෙන විට අප හද තුල ශෝකයක් හට ගන්නේ ඇයි දැයි සිරිමාන්න කල්පනා කරන්නට වුනා. එතෙක් දූර නොගොස් ඩයනා හා චාල්ස් ගේ පරදාර සේවනය ගැන සලකා බැලුවහොත් ඒ දෙදෙනාටම අනුකම්පා කරන ආසියාතික උදවිය කොතරම් ද ! එහෙත් අපේම සොපිනෝනලා, සිරියලතාලා එවැනි දෙයක් කලහොත් රජ සැලකිලි තියා මහ මග ගමන් කරන්නටවත් අපේ සුචරිතලා ඉඩ දෙයිදැයි සිරිමෙවන් සිතන්නට උනා. ඩයනලාගේ කථාව අසා සුසුම් ලන ශ්‍රී ලාංකික උපාසක අම්මලා කොතෙකුත් දැක ඇති සිරිමාන්නට අපි අපේම අයට ගරහන්නේ ඇයිදැයි සිතා ගන්නට තරම් හැකියාවක් නැත. සංසාර සාගරයක් හෝ පුනරුප්පත්තියක් විශ්වාස නොකරණ සිරිමෙවන් සිතන්නේ තමාට වරක් පමණක් ලැබෙන මේ මිනිසත් බව තම හදට එකඟව ජීවත්නොවී සංස්කෘතිය වැනි බැඳීම් වලට යටවී සිතින් පමණක් පරදාර සේවනයේ හෝ වෙනත් සම්මත පාප කර්මයක යෙදෙන මිනිසාට වඩා තම හැඟීම් අනුව ජීවත්වන මිනිසා එඩිතර කෙනෙකු ලෙසය. මෙහෙම සිතෙන දේ අවංකවම ලීවොත් තමාට ගරහන උදවිය අනන්ත බව සිරිමෙවන් දනී. එහෙත් විනය හා සංස්කෘතිය විසින් හික්මවූ හැඟීම් යටපත් කරගෙන බොරු උපාසක කමක් මවා ගැනීමට වඩා තමාද අනෙක් සියලුම මිනිසකු මෙන්ම පස් පවින් සදා නොවැලකුණු අයෙකු ලෙස පෙන්වීමට තරම් කුහකයෙකු වීමට සිරිමෙවන්ගේ සිත වරක ඔහු ඉඩ නොදේ. ජනප්‍රිය බුද්ධාගම මෙන් නොව බුද්ධ දර්ශණය තුල තිබේ යයි පැවසෙන චේතනාවම කර්මය වේයයි යන වදන අනුව සිතන විට සිතට එකඟව ජීවත් නොවී සිතින් පව් කරන උදවිය දෙරණ මත කොතරම් ජීවත් වේදැයි සිරිමෙවන්ට අනුමාණ කිරීමට අසීරු නැත.

ශ්‍රී ලාංකික මහා ගත්කරුවන් අතර යථාර්තවාදීන් වන මාටින් වික්‍රමසිංහ, එදිරවීර සරච්චන්ද්‍ර වැනි ශූරීන් සියල්ලන්ම පාහේ තම චරිතාපදාණයන් ලිවීමට මැලිවීම සිංහළ සාහිත්‍යයට වුන අතිමහත් පාඩුවක් බව සිතන සිරිමෙවන්, ජීවන සුවඳ, කරුමක්කාරයෝ වැනි යථාර්තයට ආසන්න කථා බිහිකල ගුණදාස අමරසේකර වැනි ලේඛකයන් කාලයාගේ ඇවෑමෙන් යථාර්තය යටකොට සිංහළ සංස්කෘතික රාමුව තුල සිරවීම අභාග්‍යයකැයි සිතන්නට විය. මෙය මහාචාර්ය සරච්චන්ද්‍ර පවසන පරිදි සංකල්පන ශක්තිය හීනවීමක් නොව බැවහැර නුවනට මුල්තැන දීමකැයි සිරිමෙවන් ගේ සිත කියයි. ගුණදාස අමරසේකර ශූරීන්ගේ බසින්ම පවසන්නේ නම් හැව හරින කලාකරුවකු යථාර්තවාදී හැව හැර සංස්කෘතික හා සිංහළ සදාචාර නැමති නව හැව මතු කර ගැනීමකැයි ඉහත කී ශූරීන්ගේ කෘතීන් රස විඳින්නකු වශයෙන් සිරිමෙවන්ට සිතේ.

සිරිමෙවන්ගේ ජීවිත කාලය තුල ඇත්ත ඇති සැටියෙන් පැවසෙන චරිතාපදානයක් ලියන සිංහළ කලාකරුවකු බිහිවේදැයි සිරිමෙවන්ට සැක සිත්. ඒ අඩුව සිරිමෙවන් වැනි කලාවේ අත්පොත් තබන ආධුනිකයෙකුට පිරවිය නොහැකි බැවින් සිරිමෙවන් ගේ අසම්මත කථාවද නිහඬ විය යුතු බවට සැකයක් නැත.

ලෝක පුජිත කලාකරුවන්ගේ නිර්මාණ බොහොමයක් විමර්ශණය කල හොත් ඉන් බොහොමයකට අනුභූතිය වී ඇත්තේ අසම්මත ආදර කථාවක්. ලෝක පුජිතවූ පෝල් ගොගෙන් චිත්‍ර ශිල්පියාගේ ජීවිත කථාව ලෙස හැඳින්වෙන ස්ට්‍රික්ලන්ඩ් නැමති චරිතයකට පණ පෙවූ “Moon & Six Pence” නවකථාවේ ද ප්‍රධාණ චරිතය අපේ සංස්කෘතික සීමාතුල නරුම වූ චරිතයක් නොවේදැයි සිරිමාන්න කල්පනා කරන්නට විය. එහෙත් එවන් චරිතයක් අප දන්නා හඳුනන්නේ නම් අනිවාර්යයෙන්ම අප සමාජය ඔහු පිලිකුල් කරන්නට පෙලඹෙන බව සිරිමාන්නට සැකයක් නැත.

විජයසිරි තිලකුමාර
බ්‍රිස්බේන්

---

33 වන පිටුවෙන් (බෝ ගහ හන්දියේ)

ශ්‍රීනාත් හා ජගත් සම්බන්ධ වෙලා හිටිය ගුවන් විදුලියකට මං දවසක් දුරකතන ඇමතුමක් දුන්නා වයසක කෙනෙකුගෙ කටහඬින්. මා කව්දැයි දැනගෙන ඊළඟ සතියෙම ඔවුන් මට ආරාධනා කළා අපේ කතා ගුවන් විදුලි නාට්‍යයේ වයසක කෙනෙකුගේ චරිතයක් කරන්න. එතැනින් නොනැවතී අපේ කතා පිටපත් ලියන්නත් මං හවුල් වුණා.

අපේ කතාවෙන් පස්සෙ බෝ ගහ හන්දියේ සුදා ගේ චරිතය මට බාර වුණා. අපි හැමදාම උත්සාහ කරන්නෙ අපේ චරිතය ඉතාම තාත්වික ලෙස ගොඩ නගන්න. ඒ නිසා දන්නෙම නැතුව අපේ අතිනුත් සමහර වචන වැටෙනවා.

චින්තක සිරිකුමාර මේ කන්ඩායමේ සිටින නාට්‍ය ක්ෂෙත්‍රයේ යම් යම් අත්දැකීම් ඇති තරුණයෙක්. ඔහු ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කීපයකම රඟපා තිබෙනවා.

වීදි නාට්‍ය රඟපා මං ලබා තිබූ අත්දැකීම් මෙතනදි මට ප්‍රයෝජනවත් වුණා. ඒ එක්කම නිෂ්පාදකවරයාගේ උපදෙස් අනුව අවශ්‍ය චරිතය ගොඩ නගන්න අපි හැම විටම උත්සාහ කරනවා. අවශ්‍ය පරිදි හඬ හැසිරවීම පහසු දෙයක් නෙවෙයි. කටහඬින් පමණක් අසන්නාගේ හිතේ අපට අවශ්‍ය සංවේදනය ගොඩ නගන්න අප ගන්නා උත්සාහය විශාලයි.

කතාවක් කරළා ගුවන් ගත වුනාට පස්සෙ අපි ඒක ගැන ස්වයං විවේචනයක් කරගන්නවා. අපට වැරදුණ තැන් මොනාද කියලා අපි තේරුම් ගන්නවා. අනිත් දවසේ ඒ වැරදි නැති කර ගන්න තමයි අපි උත්සාහ ගන්නෙ.. මේ නාට්‍යය අසන්නන් අතර ජනප්‍රිය වෙන් ඒකත් හේතු වෙන්න ඇති කියලා මට හිතෙනවා..

මහිල් මුණිදාස මේ කණ්ඩායමට අහම්බෙන් එක් වුණ අපූරු ශිල්පියෙක්. බෝ ගහ හන්දියේ ලකී ඔහු යි.

ඉස්සර ‘අපේ කතා’ පටිගත කරන විට මං චින්තක අයියාගේ තනියට ගියේ. දවසක් එහි එක් චරිතයකට හඬක් අවශ්‍ය වෙලා ශ්‍රීනාත් අයියා මගෙන් ඇහුවා නිකමට වගේ කරලා බලමුද කියලා. මට තාම මතකයි මං එදා කළේ විලියොං අලි අල්ලන්න යන ලොරියේ රියැදුරාගේ චරිතය. එදා ඉඳන් මාත් මේ කණ්ඩායමේ නිත්‍ය සාමාජිකයෙක් වුණා.

අපේ කාතවෙන් පස්සෙ බෝ ගහ හන්දිය පටන් ගන්නකොට මට ඒකෙ ලකීගෙ චරිතය බාර වුණා. ශ්‍රීනාත් අයියා මට විස්තර කරලා දුන්නා එයා මේ ලකීගෙ චරිතයෙන් බලාපොරොත්තු වන ගතිගුණ. ඒ අනුව මං ඒ චරිතය ගොඩනගන්න උත්සාහ කළා. වචන උච්ඡාරණය පවා ඒ පරිසරයට ගැළපෙන අන්දමට කරන්න මං උත්සාහ කරනවා.

මේ ලකී වගේ මිනිස්සු කතා කරන හැසිරෙන විදිහ අපි වැදගත් යයි කියන සමාජයට දිරවන්නෙ නැහැනෙ. ඒත් මේ මිනිස්සු අපේ සමාජයේ කොටස් කාරයෝ. මේ අමුතු මිනිස්සු ළඟ තියෙන මනුස්සකම් මතු කරන්න මගේ චරිතය තුළින් මං උත්සාහ කරනවා.

ඇත්තටම මටත් මේක අභියෝගයක්. එහෙම කිව්වෙ මාලන් සුරවීර. මේ නාට්‍යයට සම්බන්ධවෙන්න මට ඉඩක් ලැබීම සතුටක්.. බෝ ගහ හන්දියට වරින් වර ගොඩ වෙලා චරිතයක් කිරීමෙන් මං විශාල අත්දැකීමක් ලබනවා. අපි වගේ ආධුනික ශිල්පීන්ට මේ වගේ අවස්ථාවක් ලැබීම විශාල දෙයක් කියලයි මට හිතේනනෙ.

ශ්‍රීනාත් මද්දුමගේ ශ්‍රී ලංකාවේදී ගුවන් විදුලි නාට්‍ය ක්ෂෙත්‍රයේ විශාල අද්දැකීම් ඇති ශිල්පියෙක්. සයිමන් නවගත්තේගම ඔහුගේ වානරයා පොතේ පෙරවදනේ ශ්‍රීනාත් ගැන තබා ඇති සටහන එයට සාක්ෂියක්. නවගත්තේගම මහතා සිරස ගුවන් විදුලිය වෙනුවෙන් ලියූ වානරයා ගුවන් විදුලි නාට්‍යයේ වානරයාගේ චරිතය ඉදිරිපත් කලේ ශ්‍රීනාත්. තමාගේ වානරයා සාර්ථක වුණේ ශ්‍රීනාත්ගේ දක්ෂතාව නිසා බව සයිමන් නවගත්තේගම ශූරීන් ‘වානරයා’ පොතේ පෙරවදනේ ම ලියා තිබෙනවා. ඉතින් එවන් දක්ෂතා ඇති ශිල්පියකුගෙන් නිසි ප්‍රයෝජනයක් ගන්න මෙල්බන් සමාජයට ඉඩක් ලැබී තිබීම ඔවුන්ගෙ භාග්‍යයක්.

''අපි සති දෙකකට වරක් රැස් වෙනවා. සාමාන්‍යයෙන් එදාට අපි කතා දෙකක් පටිගත කරනවා.. මුළින්ම අපි සියලු දෙනාම එක් වෙලා කතාව කියවාගන්නවා. එතැනදී මං මට අවශ්‍ය චරිත ස්වභාවයන් පිලිබඳ වැටහීමක් නලු නිලියන්ට ලබා දෙනවා. ඔවුන්ට නිදහස තියෙනවා තමන්ට අවශ්‍ය පරිදි තමන් අතිනුත් යමක් තම තමන්ගේ චරිත වලට එකතු කරගන්න. පටිගත කිරීමට යන්නෙ ඉන් පසුවයි. අපට තිබෙන අඩු පහසුකම් යටතේ වුණත් ජගත් සෑහෙන උත්සාහයක් අරන් පටිගත කිරීම් කරනවා. මේ සඳහා අපට සේනාධීර සොහොයුරාගෙන් ලැබෙන සයහත් අමතක කරන්න බැහැ.

මේ පටිගත කිරීමක් සාමාන්‍යයෙන් රාත්‍රී 8 සිට රාත්‍රී 1 පමණ වන තුරු සිදු කෙරෙනවා. ඉන්පසු දිනෙක ඒ මූලික පිටපතෙහි අනවශ්‍ය කොටස් ඉවත් කර අවශ්‍ය පසුබිම් ශබ්ද ආදිය ඇතුල් කරළා අවසන් කරන්න තවත් පැය කීපයක් අපට මහන්සි වෙන්න සිදුවෙනවා. අපි කොහොම හරි ඉරිදා උදේ වන විට ගුවන් විදුලියට සංගත තැටිය යවනවා. මේ සඳහා කීර්ති පොතුවිල සොහොයුරා දෙන සහය හරිම වැදගත්.

බෝ ගහ හන්දියට සංගීතය සැපයූ තරුපති මුණසිංහ සොහොයුරාත් මෙල්බන් 3ZZZ ගුවන් විදුලියේ අපේ හිතවතුන් සියලුම දෙනාත් අමතක කරන්නම බැහැ. '' ශ්‍රීනාත් කිව්වා.

ඉරිදා උදේ ඔබ සුවසේ වාඩි වී අසන බෝ ගහ හන්දිය නාට්‍යය ඔබ වෙත ගෙන එන්න මේ පිරිස දරන උත්සාහය කොයි තරම්ද කියලා අපසු එන අතරේ මට හිතුණා. පිටවෙලා එන වෙලාවෙ ශ්‍රීනාත් කිව්ව කියමන තාමත් හිතේ රැව් පිලිරැව් දෙනවා.

''මේක හරිම සුන්දර වැඩක්. අපි හැමෝම එක කණ්ඩායමක් ලෙස එකමුතුව පුදුම සතුටකින් මේක කරන්නෙ. බෝ ගහ හන්දිය කිරීමෙන් අපි ලබන එකම ලාබය මේ සතුට තමයි''